මාර්ගගත දැන්වීම

# ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම

## පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව

## Post Graduate Diploma in Educational Management (Full Time) - 2025/2026

## පූර්ණ කාලීන 2025/2026 - සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය

**ජාතික අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උක්ත පාඨමාලාව සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.**

| | | |
|---|---|---|
| පාඨමාලාවේ කාලය | : | පූර්ණ කාලීන-අවුරුදු එකයි. |
| පාඨමාලාවේ ස්වභාවය | : | අධ්‍යයන වාර 03 කින් මාර්ගගත ක්‍රමයට පාඨමාලාව පැවැත්වේ. (අවශ්‍යතාවය මත වාරයකට දෙවතාවක් ආයතනයට කැඳවීමට කටයුතු කරනු ලැබේ.) |
| පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | : | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක. |
| පාඨමාලාව පැවැත්වෙන මාධ්‍යය | : | සිංහල /දෙමළ /ඉංග්‍රීසි |
| පාඨමාලා ගාස්තුව | : | රුඃ 80,000/= කි. (සමාන වාරික 02 කින් ගෙවිය හැකිය). අයදුම්පත් ගාස්තුව රු. 1,500/= , ලියාපදිංචි ගාස්තුව රු. 2,000/= |

### ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

i. ඉල්ලුම්පත් කැඳවීමේ අවසන් දිනට පහත සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය/විදුහල්පති සේවය/ගුරු අධ්‍යාපනඥ සේවයට අයත් වීම/පිළිගත් රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය අධ්‍යාපන ආයතනයක ප්‍රධානියෙකු වීම හෝ පරිවේනාධිපති තනතුරක් හෙබවීම

ii. (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය

හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් ලබාගත් වෙනත් විෂය ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව/පුහුණු ගුරු සහතිකය හෝ ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව වැනි වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

iii. අවම වශයෙන් අවුරුදු හතරක ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම සහ ඉන් අවුරුදු දෙකක්වත් පරිපාලන හා අධීක්ෂණ කටයුතුවල නිරතව සිටීම. (පරිපාලන හා අධීක්ෂණ කටයුතු පිළිබඳ පළපුරුද්ද සහ සේවා වාර්තාව සම්මුඛ පරීක්ෂණයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/දෙපාර්තමේන්තු ප්‍රධානි මගින් ලබාගත් ලිපියක් මගින් තහවුරු කළ යුතුයි)

iv. තෝරා ගනු ලබන අධ්‍යයන වර්ෂයේ දී (2025/2026) ජාතික අධ්‍යාපන ආයතනයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක හෝ වෙනත් අධ්‍යාපන ආයතනයක හෝ කිසිදු පූර්ණ කාලීන පාඨමාලාවක් හදාරමින් නොසිටීම.

### පාඨමාලාව සඳහා තෝරා ගැනීම

සියලුම අයදුම්කරුවන් වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් මාර්ගගත ක්‍රමයට පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට සමත් විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු පිළිවෙළ**

1.0 අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ආකාරය **exams.nie.lk/intakes/new** වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. (Sign up) සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැක **exams.nie.lk/info/register-as-a-user** පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

2.0 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දැක්වෙන කොටු දෙකෙහි පරිශීලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Log in)

2.1 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව (User Profile) යාවත්කාලීන (Update) කරන්න.
- පෞද්ගලික තොරතුරු
- සේවා තොරතුරු
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

2.2 **exams.nie.lk/new intake** Postgraduate Diploma in Educational Management (Full Time) පාඨමාලාව තෝරා ගන්න.

2.3 My application තෝරා ගන්න. තොරතුරු නිවැරදිව ඇතුළත් කර එය නැවත පරීක්ෂාකර අයදුම්පත්‍රය යොමු කරන්න. (අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැකිය. **exams.nie.lk/info/applying-for-new-enrollments**

2.4 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය (Application Reference Number) සටහන් කර තබා ගන්න.

3.0 **අයදුම්පත බාගත කිරීම (Download Application)**
මාර්ගගත (Online) අයදුම්පත සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබගේ යොමු අංකය (Reference Number) සමඟ ලැබෙන විස්තර ඇතුළත් පිටපත මුද්‍රණය කර එය ආයත ප්‍රධානියා මඟින් සහතික කරවා ගෙන, මුදල් ගෙවන ලද රිසිට් පතෙහි මුල් පිටපත සහ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව, **අධ්‍යක්ෂ, වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය, ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ හන්දිය, පාදුක්ක.** ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

1 ප්‍රථම උපාධි සහතිකය
2 පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකය / පුහුණු ගුරු සහතිකය හෝ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය
3 පත්වීමේ ලිපිය (පාඨමාලාවට අදාල)
4 සේවා සහතිකය

ඔබගේ ලේඛන බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "PGDEM Full Time 2025/2026 (Sinhala) " යනුවෙන් සඳහන් කළ යුතු ය.

4.0 වැඩිදුර විස්තර සඳහා සිංහල මාධ්‍යය පාඨමාලා සමායෝජක M. M. K. J මණතුංග මිය 0778425488/0117601307 දෙමළ මාධ්‍යය පාඨමාලා සමායෝජක T.රවිචන්ද්‍රන් මයා 0779697879/0117601315 ඉංග්‍රීසි මාධ්‍යය පාඨමාලා සමායෝජක M. M. K. J මණතුංග මිය 0778425488/0117601307 තාක්‍ෂණික සහාය සඳහා මාධව තෙන්නකෝන් මයා 0117601777 / 0117601776 දුරකථන අංකවලට සතියේ දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 4.00** දක්වා අමතන්න.

**අයදුම්පත් බාරගැනීමේ අවසන් දිනය** 2025.10.31

**සැ.යු -** අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය කිසිදු හේතුවක් නිසා නැවත දීර්ඝ නොකරන බව කාරුණිකව දන්වමි.

**මහාචාර්ය මංජුලා විතානපතිරණ (PhD)**
අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.